මම ස්වර්ගයේ දොරටුව අසල සිටගෙන සිටියෙමි. එවිට පොදුවේ දුප්පතුන් එහි පිවිසුණහ. ධනය ඇත්තෝ වළක්වනු ලැබූවෝ වූහ.

උසාමා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. ((මම ස්වර්ගයේ දොරටුව අසල සිටගෙන සිටියෙමි. එවිට පොදුවේ දුප්පතුන් එහි පිවිසුණහ. ධනය ඇත්තෝ වළක්වනු ලැබූවෝ වූහ. නමුත් නිරා වැසියන්, ඔවුන් නිරා ගින්න වෙතට අණ
කරනු ලැබීය. තවද මම නිරයේ දොරටුව ඉදිරියේ සිට ගෙන සිටියෙමි. එවිට පොදුවේ එහි කාන්තාවන් පිවිසුණහ.))
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

පොහොසතුන්ට පෙර දුප්පතුන් හා දිළිඳුන් ස්වර්ගයට පිවිසෙති. හේතුව නියත වශයෙන්ම ඔවුන් දිළිඳුන්ය ඔවුනට කිසිදු ධනයක් නොවීය. එහෙයින්, ඒ සම්බන්ධයෙන් ඔවුන් විනිශ්චය කරනු නොලබති. එය අල්ලාහ්ගෙන් වූ සංග්රහයක් වශයෙනි. තවද මෙලොවෙහි පැවති සුව පහසුකම් හා එහි අලංකරණයන් අතුරින් ඔවුනට අහිමි වූ දෑ වෙනුවට පිරිනැමීමක් වශයෙනි. ධනවතුන් අතුරින් විනාශ වී යන සම්පත් සන්තකයේ තිබූවන් හා තරාතිරම් අැත්තවුන් වනාහි, ඔවුනට තිබූ අධික ධනය, සැප පහසුකම්, එමෙන්ම ඒවා තුළින් ඔවුන් ලබා ගත් වින්දනය, ඔවුන්ගේ ආත්මාශාව හා කැමැත්ත පරිදි ඔවුන් භුක්ති විදීම යන හේතුන් නිසා ඒවා පිළිබඳ දීර්ග ලෙස විනිශ්චය කරනු පිණිස කියාමත් දිනයේ එලිමහනේ රඳවා තබනු ලබති. මෙලොව අනුමැතිය ඇති දෑ විනිශ්චය කරනු ලබන්නකි. එමෙන්ම මෙලොව තහනම් කරනු ලැබූ දෑ දඬුවම් ලබා දෙන්නකි. දුගී දුප්පතුන් මෙයින් මිදෙති. නිරයට අධික වශයෙන් පිවිසෙනුයේ කාන්තාවන්ය. හේතුව නියත වශයෙන්ම ඔවුන් අධික වශයෙන් දොස් නගා පැමිණිලි කරන බැවින් හා තම ස්වාමීන් සමග යහපත් ලෙස කටයුතු කිරීමට පිටුපාන හෙයිනි.

http://sunnah.global/hadeeth/si/show/3745